# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1537/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 03/10/2024 පැය 0850

## මාධ්‍ය නිවේදනය

**මන්නාරම ගරු මහාධිකරණ විනිසුරුතුමාට අපහාසාත්මක දැන්වීම් ඇලවීම සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.08.28 වන දින මන්නාරම ගරු මහාධිකරණයේ විනිසුරුතුමාගේ ඡායාරූපය ඇතුළත් කරමින් එතුමාට අපහාසයක් සිදුවන අයුරින් කොළඹ තදාසන්න ප්‍රදේශයන්වල යම්කිසි පිරිසක් විසින් දැන්වීම් (පෝස්ටර්) ඇලවීම සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඒ අනුව 2024.09.11 වන දින මෙම සිද්ධියට සම්බන්ධ අවුරුදු 22, 23 හා 44 වයස් වල පසුවන මඩපාත, මාතලේ හා පන්නිපිටිය ප්‍රදේශවල පදිංචි සැකකරුවන් තිදෙනෙකු පෝස්ටර් ඇලවීමට යොදාගත් ත්‍රීරෝද රථයක් සහ යතුරුපැදියක් ද සමඟ අත්අඩංගුවට ගෙන 2024.09.12 වන දින කොළඹ ගරු ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත.

2024.10.02 වන දින දහවල් කාලයේදී මෙම සිද්ධියට සම්බන්ධ තවත් සැකකරුවන් දෙදෙනෙකු කැලණිය හා දෙහිවල ප්‍රදේශවලදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරින් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් සන්තකයේ තිබූ ජංගම දුරකථන තුනක් පොලිසිය භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 27 හා 41 වයස් වල පසුවන අඹකොටේ සහ දෙහිවල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන් පෝස්ටර් නිර්මාණය කිරීම, මුද්‍රණය කිරීම හා සන්තකයේ තබාගැනීම සිදුකර ඇති බවට විමර්ශනයේදි අනාවරණය වී ඇත. සැකකරුවන් දෙදෙනා 2024.10.03 වන අද දින කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. මෙම සිද්ධියට සම්බන්ධ අනෙක් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**